දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832
ලේකම් / செயலாளர் / Secretary } 2784811
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
Fax: 2784846
ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/26/16/01/01

දිනය / திகதி / Date } 2011-06-21

**චක්‍රලේඛ අංක - 2011/21**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

## 'Schoolnet' වැඩසටහන

2006 වසරේ සිට ශ්‍රී ලංකාවේ පාසල් ජාලය සම්බන්ධ කර අන්තර්ජාල පහසුකම් සහ වෙනත් ඉගෙනුම් අවස්ථාවන් සහ ආධාර ලබා දීම අරමුණු කරගෙන ස්ථාපිත කරන ලද 'Schoolnet' සේවාව 2010 වසර අවසානය දක්වා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ අතර 2011 වසරේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන භාවිත කරමින් ක්‍රියාත්මක වේ.

ඒ අනුව මෙම වැඩසටහනෙහි උපරිම ප්‍රතිඵල ලබා ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් මෙහි සම්බන්ධීකරණය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරනු ලබන අතර පාසල්වලට වැඩි සේවාවක් ලබාදීම සඳහා පහත සඳහන් පියවර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ කලාප අධ්‍යාපන කාර්යාල මගින් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

1. 'Schoolnet' වැඩසටහන පළාත් මට්ටමින් සම්බන්ධීකරණය සඳහා පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරී වෙත වගකීම පැවරීම
2. කලාප මට්ටමින් සම්බන්ධීකරණය සඳහා කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරී වෙත වගකීම පැවරීම

පවතින ගැටලු ලබා ගැනීමත්, ඒ පිළිබඳ අදාළ සේවා සපයන්නන් දැනුවත් කර පිළියම් ලබා ගැනීමත් සඳහා මෙම ස්ථාන දෙකෙහිම උපකාරක සේවයක් (help desk) පවත්වා ගත යුතු වන අතර, ඊට අදාළ දුරකථන අංක පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය සහ අදාළ ආයතන දැනුවත් කළ යුතු ය.

එමෙන් ම මෙම ස්ථානවල ඒ ඒ පාසල් හෝ ආයතන මගින් ඉදිරිපත් වන ගැටලු හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග සඳහන් කිරීම උදෙසා ලැබුණේ කාගෙන් ද, ඉදිරිපත් කළේ කාට ද, දිනය සහ වේලාව ආදී කරුණු ද ඇතුළත් වන සේ ලොග් සටහනක් තබා ගත යුතු ය.

එමෙන් ම සියලු ම විදුහල්පතිවරුන් විසින් තම පාසල්වල මෙම සේවාව යම්කිසි හෙයකින් අකර්මන්‍ය වූයේ නම් ඒ පිළිබඳව දැනුම්දුන් වේලාව, දිනය සහ දැනුම්දුන්නේ කාට ද යන කරුණු ද ඇතුළත් වන සේ ලොග් සටහන් තබා ගැනීම අනිවාර්ය බව වැඩිදුරටත් දන්වමි.

එච්. එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන), අධ්‍යාපන අමාත්‍යාංශය
2. ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
3. අධ්‍යාපන අධ්‍යක්ෂ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය
4. සියලු ම පළාත් ගණකාධිකාරීවරුන්
5. විගණකාධිපති

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832
ලේකම් / செயலாளர் / Secretary } 2784811
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල
'இசுறுபாய', ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................

මගේ අංකය / எனது இல. / My No. } ED/01/26/16/01/01

දිනය / திகதி / Date } 2011-09-26

චක්‍රලේඛ අංක 2011/21/(i)

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

**'Schoolnet' වැඩසටහන**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2011.06.21 නිකුත් කරන ලද 2011/21 දරණ චක්‍රලේඛයට අදාළව 'Schoolnet' වැඩසටහනෙහි පරිපාලන, නඩත්තු, තාක්ෂණික හා මූල්‍ය කටයුතු නැවත දන්වන තුරු අධ්‍යාපන අධ්‍යක්ෂ (සැපයීම්) යටතේ සිදු කරනු ලබන බවත් විධිමත් කාර්ය මණ්ඩල බඳවාගැනීම සිදුකිරීමෙන් අනතුරුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යක්ෂ වෙත නැවත පවරන තෙක් ඉහත සංශෝධන සිදුකරන බවත් දන්වා සිටිමි.

ඒසේ වුව ද 2011/21 දරණ චක්‍රලේඛයේ සඳහන් පළාත් හා කලාප සම්බන්ධීකරණ කටයුතු සංශෝධනය නොවන බව වැඩිදුරටත් දන්වමි.

එච්.එම්.ගුණසේකර
ලේකම
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

1. අධ්‍යක්ෂ (සැපයීම)
2. අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
3. අධ්‍යක්ෂ, 'School Net' ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය/ මොරටුව විශ්ව විද්‍යාලය.
4. ප්‍රධාන ගණකාධිකාරී
5. ගණකාධිකාරී (ගෙවීම)
6. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)